# කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය



පි.පි.එස්.ජේ කිත්සිරි
පරිසර නිළධාරි
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව

# ඩෙන්මාර්ක් කසල මධ්‍යස්ථානයේ ඉදි කිරීමෙහි වර්තමාන තත්ත්වය හා මූල්‍ය විග්‍රහය

20'×20' ප්‍රමාණයේ ගොඩනැගිලි තුනක් එක පෙලට ඉදි කිරීමට සැලසුම් සකස් කරන ලද අතර එම ගොඩනැගිලි තුන සමාන්තර ලෙස එක පෙලට අඩි 10ක් පරතරයකින් ඉදි කිරීමට කටයුතු කරන ලදී. එයට හේතුව ලෙස දැක්විය හැක්කේ ගොඩනැගිලි දෙක අතර වන අඩි 10 ප්‍රමාණය පසු කාලීනව වහල පමණක් ඉදි කර මෙම ගොඩනැගිලි තුනම එක් ගොඩනැගිල්ලක් ලෙස භාවිතයට ගැනීමේ හැකියාව පවතින බැවිනි.

කෙසේ වෙතත් කසල ප්‍රතිචක්‍රිකරණ කටයුතු පහසු කර ගැනීම සඳහාත් ගොඩනැගිලි දෙක අතර හිඩැස මගින් අධික වැසි අවස්ථා වලදී කසල තෙම්ම වළක්වා ගැනීම සඳහාත් අදාල අඩි 10 පරතරයේ වූ හිස් කොටස් දෙකෙන් එකක් සඳහා බිත්ති බැද වහල යෙදීමටත් අනික කොටස සඳහා වහල පමණක් යෙදීමටත් කටයුතු කර මේ වන විට එක් ගොඩනැගිල්ලක් බවට පත් කර ඇත.

මෙහි **කොන්ත්‍රාත්කරු ලෙස සිංහපුර ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය කටයුතු කරනු** ලබන අතර මෙම සමිතිය වෙත කොන්ත්‍රාත් පිරිනැම්ම සඳහා වන නිර්දේශය ගග ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් මගින් ලබා ගෙන ඇත.

මේ වන විට **ඉදි කිරීම් අවසන් කර ඇති ගොඩනැගිලි හා වැඩ අවසන් කල දින** හා **වැය වු මුදල් ප්‍රමාණය** පහත පරිදි වේ.

| අනු අංකය | ගොඩනැගිලි විස්තරය | ඉදි කිරීම් අවසන් වු දිනය | වැය වු මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | C ගොඩනැගිල්ල | 2019.06.18 | රු. 1,249,121.95 |
| 02 | B ගොඩනැගිල්ල | 2019.07.14 | රු.1,070,274.42 |
| 03 | C හා B ගොඩනැගිලි සම්බන්ධ කිරීම | 2019.08.19 | රු.346,051.86 |
| 04 | A ගොඩනැගිල්ල | 2019.10.31 | රු. 711,768.54 |
| 05 | A හා B ගොඩනැගිලි සම්බන්ධ කිරීම | | රු.85,984.03 |
| 06 | කාණු පද්ධතිය හා වැහි පිහිලි සකස් කිරීම | 2019.09.10 | රු.409,743.10 |
| මෙතෙක් මුළු වියදම | | | **රු.38,72,943. 90** |

අනු අංක 01 සිට 05 දක්වා මුදල් ගෙවා ඇති අතර අංක 06 සදහා වන බිල්පතට අදාල ප්‍රතිපාදන ලබා ගැනිම සදහා ගරු සභාපතිතුමාගේ මැදිහත් විම මත පළාත් පාලන කොමසාරිස්තුමා සමග කල සාකච්ඡාවේදි කරන ලද ඉල්ලීම අනුව මෙම ගොඩනැගිල්ල වටා කාණු පද්ධතිය ඉදි කිරිමටත් වැහි පිහිළි යෙදිමටත් රු. 409,743. 10ක මුදල ලබා දෙන ලදී. බිල්පතට අදාල මුදල් මෙතෙක් ගෙවිම සදහා පළාත් පාලන දෙපාර්තමේන්තව මුදල් ලබා දි නොමැත. මෙම ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවු බැවින් අමතර ප්‍රතිපාදන ඉල්ලීමට එය ද ඇතුලත් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිළධාරි මගින් වැහි පිහිලි හා කාණු පද්ධතිය ඉදි කිරිම සදහා රු. 270,000.00 ඇස්තමේන්තුවක් සකස් කර මේ වනවිට වැඩ නිම කර ඇති අතර ගෙවිම් සිදුකර නොමැත.

එමෙන්ම මෙම මධ්‍යස්ථානය සඳහා වැසිකිලි පද්ධතියක් සඳහා ද ඇස්තමේන්තුවක් සකස් කර වැඩ ආරම්භ කර ඇති අතර ඒ සඳහා ද රු.585,000.00ක මුදලක් වැය වේ. එය ද අමතර ප්‍රතිපාදන ඉල්ලීමට ඇතුලත් කර ඇත.

ඒ අනුව මෙම මධ්‍යස්ථානයේ සභා අරමුදල් මගින් මෙතෙක් කර ඇති ඉදි කිරීම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1.C ගොඩනැගිල්ල සඳහා | - | 1,249,121.95 |
| 2.B ගොඩනැගිල්ල සඳහා | - | 1,070,274.42 |
| 3. C හා B ගොඩනැගිලි සම්බන්ධ කිරීම සඳහා | - | 346,051.86 |
| 4. A ගොඩනැගිල්ල සඳහා | - | 711,768.54 |
| 5. A හා B ගොඩනැගිලි සම්බන්ධ කිරීම සඳහා | - | 85,984.03 |
| **මෙතෙක් වියදම** | - | **3,463,200.80** |

මෙම මුදල ගෙවීමේදී

| | | |
|---|---|---|
| • 2019 අයවැය මගින් | - | 2,500,000.00 |
| • 2019.08.20 තීරණ අංක 5.01.03 අනුව ස්ථාවර තැන්පතු වලින් ලබා ගැනීමට මහසභාවට යෝජනා කරන ලද රු.4,480,000.00 වෙනුවට 2018 ගිණුම් ගත නොකල මුද්දර ගාස්තු වලින් ලබා දෙන මුදල | - | 3,864,855.04 |
| **මුළු ප්‍රතිපාදන මුදල** | - | **6,364,855.04** |

ඉතිරි ප්‍රතිපාදන මුදල (6,364,855.04 - 3,463,200.80 ) - **2,901,654.24**

ඉතිරි ප්‍රතිපාදන මුදලින් තවදුරටත් ගෙවීමට ඇති මුදල් විස්තර පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. ඉතිරි කාණු පද්ධතිය හා වැහි පිහිලි සකස් කිරීම සඳහා | - | 270,000.00 |
| 2. වැසිකිලියක් ඉදි කිරීම සඳහා | - | 585,000.00 |
| | | **855,000.00** |

| | | |
|---|---|---|
| ඒ අනුව තවදුරටත් ඉතිරි ප්‍රතිපාදන මුදල | - | 2,901,654.24 |
| | - | ( 855,000.00 ) |
| | | **2,046,654.24** |

මේ අනුව දැනට කසල ප්‍රතිචක්‍රීකරණ කටයුතු ආරම්භ කර ඇති මෙම මධ්‍යස්ථානයේ තවදුරටත් ඉටු කල යුතු කාර්යයන් පහත පරිදි වන බවද සඳහන් කරමි.

1.විදුලිය ලබා ගැනීම

2.ජලය ලබා ගැනීම

3.අංගනය වටා කොටුදැල් ආවරණයක් හා ගේට්ටුවක් ඉදි කිරීම

මෙම කාර්යයන් සඳහා තවදුරටත් ඉදිරිව ඇති ප්‍රතිපාදන මුදල වන රුපියල් 2,046,654.24 මුදල යොදා ගැනීමට අපේක්ෂා කරන බව ද සඳහන් කරමි.

මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට කරන ලද ඉල්ලීම් අනුව 2020.03.06 දිනැතිව රු.මි.4.5ක මුදලක් පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති 2020 පළමු කාර්තුව යටතේ වෙන් කර දී ඇති අතර එම ප්‍රතිපාදන මගින් පහත කාර්යයන් ඉටු කිරීමට යෝජනා වී ඇත.

| | | |
|---|---|---|
| 1. කසල දාහකයක් සපයා සවි කිරීම | - | 2,500,000.00 |
| 2. කසල හැලීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම | - | 350,000.00 |
| 3. කසල කැපීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම | - | 150,000.00 |
| 4. කසල අංගනයේ මිදුල හා පිවිසුම් මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම | - | 1,500,000.00 |
| **මුළු එකතුව** | - | **4,500,000.00** |




